Prepared by- පී.ඊ.එම්.ආර්.ආර්.ආර්.ඒකනායක

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

**2.10.1 :** නාට්‍යට උචිත සංගීතය නිර්මාණය කරයි.

නාට්‍ය සංගීතය ආහාර්ය අභිනයට අයත් අනුශාංගික අංගයකි.එහෙත් නාට්‍ය ගීත වාචික අභිනයට අයත් වේ.නාට්‍ය සංගීතය අනුශාංගික කලා කරුවන් විසින් නිර්මාණය කරන අතර ,නාට්‍ය ගීත රඟන නළු නිලියන් විසින් ගායනා කිරීම බහුලව දක්නට ඇත.නාට්‍ය සංගීතය හා ගීත වර්තමානය වන විට නාට්‍ය ශෛලීන් දෙක (ලෝක ධර්මී,නාට්‍ය ධර්මී ) සඳහාම භාවිතා කරන අයුරු දැක ගත හැක.

ඕනෑම පෙළ රචනයක අවශ්‍යතාවය මත නාට්‍ය සංගීතය භාවිතා කිරීමේ හැකියාව ඇත.නාට්‍යයෙහි සියුම් අවස්ථා මතුකරමින් පෙළෙහි අර්ථකතනය උද්දීපනය වන අයුරින් නාට්‍යයේ සාර්තකත්වය ඉහල තලයකට ගෙන යාමට නාට්‍ය සංගීතයට හැකියාව ඇත.නාට්‍ය නිෂ්පදක වරයාගේ අදහසට අනුව නාට්‍යයේ ශෛලිය,යුගය,නාට්‍ය අයත් සංස්කෘතික පසු බිම ( නාට්‍ය කතා වස්තුව අයත් රට ) වැනි කරුණු සලකා බලමින් සංගීතය නිර්මාණය කරනු ලබන්නේ සංගීත අධ්‍යක්ෂ්‍ය වරයා විසිනි.

<u>නාට්‍යයට සංගීත භාවිතයෙන් අත්වන ප්‍රයෝජන</u>

**1.**තේමාව ප්‍රේක්ෂකයා වෙත ගෙනයාම

**2.**නාට්‍ය අවස්තා තීව්‍ර කිරීම

**3.**ප්‍රේක්ෂකයා තුල රසය ජනනය කිරීම

**4.**නාට්‍යයේ රිද්මය පවත්වාගෙන යාමට උපකාර වීම

**5.**රංගනයේදී හැගීම් ඉස්මතු කරවීම සඳහා නළු නිලියන්ට පහසුවක් වීම

<u>නාට්‍ය සංගීත නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු</u>

**1.**නාට්‍ය සඳහා අවශ්‍ය නම් පමණක් සංගීතය යොදා ගැනීම ( නාට්‍ය තුල නිහැඬියාවද සංගීතයක් විය හැකි බව ප්‍රවීනයන්ගේ පිළිගැනීමකි )

**2.**නාට්‍ය අයත් කාලය (යුගය ),දේශය පිළිබඳ සැලකිලිමත් වීම ඒ අනුව සංගීත භාණ්ඩ යොදා ගැනීම

**3.**නාට්‍ය අධ්‍යක්ෂක වරයාගේ අර්ථකථනයට භාධාවක් නොවීම.

**4.**නාට්‍ය ශෛලිය වටහා ගැනීම

**5.**නාට්‍යට උචිත අයුරින් ප්‍රාසංගික බව ලබාදීම

<u>නාට්‍ය සංගීතය භාවිත නාට්‍ය</u>

**1.**මනමේ **2.**සිංහ බාහු **3.**විකෘති **4.**රත්නාවලී **5.**තාරාවෝ ඉගිලෙති

නාට්‍ය සංගීතය භාවිතා නොකරන ලද නාට්‍ය

**1.**කැළණි පාලම **2.**මගුල් ප්‍රස්තාව **3.**අහසින් වැටුනු මිනිස්සු **4.**ලාස්ට් බස් එකේ කතාව

**5.**චන්ද්‍රාවතී සමග රාත්‍රියක්

නාට්‍ය සඳහා සංගීත නිර්මාණය කල සංගීත අධ්‍යක්ෂකවරු

**1.**ජයන්ත අරවින්ද ශූරීන් **2.**ආචාර්ය ප්‍රේමසිරි කේමදාස මහතා **3.**ඔස්ටින් මුණසිංහ මහතා

**4.**නවරත්න ගමගේ මහතා **5.**ඩබ්.ඩී.අමරදේව ශූරීන් **6.**ශාන්ත පීරිස් මහතා

**7.**සෝමදාස ඇල්විටිගල මහතා

පැවරුම්

**1.**නාට්‍ය සංගීතය නිර්මාණය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න

**2.**නාට්‍ය සඳහා සංගීත නිර්මාණය කිරීමේ වැදගත්කම පිළිබඳ කරුණු **5**ක් ලියන්න

**3.**නාට්‍ය **5**ක් නම් කර එම නාට්‍ය සඳහා සංගීතය නිර්මාණය කරන ලද ශිල්පීන්ගේ නම් ඇතුලත් වගුවක් සකසන්න.